Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

පළමු වාරය - ජනවාරි - 2 වන සතිය

09 ශ්‍රේණිය

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

<u>තොරතුරු පත්‍රිකාව</u>

# නාට්‍ය ශෛලීන් හඳුනා ගනිමු.

- යමක් ප්‍රකාශයට පත් කරන අකාරය ශෛලියක් ලෙස හඳුන්වයි. ලේඛනයේ දී, කථනයේ දී සේම වෙනත් කලා මාධ්‍යයන්වල ද ශෛලීන් භාවිත කරයි.
- භරතමුනිගේ 'නාට්‍ය ශාස්ත්‍රය' නම් ග්‍රන්ථයේ දැක්වෙන පරිදි නාට්‍ය ශෛලීන් ප්‍රධාන ලෙස කොටස් 02කට බෙදා දැක්විය හැක.

  - *ලෝක ධර්මී නාට්‍ය ශෛලිය*
  - *නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලිය*

## ලෝක ධර්මී නාට්‍ය ශෛලිය

- නාට්‍ය පෙළෙහි ඇතුළත් කතා වස්තුව, ගමන් තාල, සංවාද, රංග භාණ්ඩ, රූපණය, වේෂ භූෂණ ආදී වූ සියල්ල ස්වාභාවික ලෝකයට බෙහෙවින් සමීප ආකාරයෙන් ඉදිරිපත් කරන ශෛලිය 'ලෝක ධර්මී නාට්‍ය ශෛලියයි'.
- 

උදා:-
- *R.R.සමරකෝන් මහතාගේ <u>කැළණි පාලම නාට්‍යය</u>*
- *රංජිත් ධර්මකීර්ති මහතාගේ <u>මෝදර මෝල නාට්‍යය</u>*
- *ජයලත් මනෝරත්න මහතාගේ <u>තුලමල පිපිලා නාට්‍යය</u>*
- *හෙන්ඩ්රික් ඉබ්සන්ගේ <u>Dolls House (රූකඩ ගෙදර නාට්‍යය)</u>*



කැළණි පාලම



විකෘති




තලමල පිපිලා

- ## නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලිය

  - ලෝක ස්වභාවයට අනුගත නොවන අයුරින් කිසියම් සම්ප්‍රදායික ලක්ෂණ මතුවන ආකාරයට නැටුම්, ගැයුම්, වැයුම් අභිනය සහ සංකේත භාවිතා කරමින් නාට්‍ය ඉදිරිපත් කරන ශෛලිය 'නාට්‍ය ධර්මී ශෛලියයි'.

උදා:- ◌ *මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ <u>මනමේ හා සිංහබාහු නාට්‍යය</u>*
◌ *දයානන්ද ගුණවර්ධන මහතාගේ <u>නරිබෑණා නාට්‍යය</u>*
◌ *බන්ධුල ජයවර්ධන මහතාගේ <u>බෙරහඬ නාට්‍යය</u>*



මනමේ



සිංහබාහු



කදා වළලු



බෙරහඬ

✧ නූතනයේ බොහෝ නාට්‍යයවල ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ලක්ෂණ මිශ්‍රව නිර්මාණය වන මිශ්‍ර ශෛලියක් දක්නට ලැබේ.

## කදා වළලු නාට්‍යයට අදාළ නාට්‍ය ශෛලියෙහි ලක්ෂණ:-

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් නිර්මාණය කළ කදා වළලු නාට්‍යයේ පහත දැක්වෙන ලක්ෂණ දක්නට ලැබේ.සංවාද භාවිතය නාට්‍ය ශෛලීන් දෙකම අනුව යොදා ගෙන තිබීම.

*උදා:- නාට්‍යය ආරම්භයේ දී නාට්‍ය ධර්මී ලක්ෂණ විදහා පාමින් අතීත වක්තෘගේ සින්දුව ගායනය කරමින් දකුණු පසින් ගමන් කරයි.*

*'අතීතයෙහි මෙම කපට පෙර වූ*

*කපෙහි පස්වැනි බෝසතාණෝ'*

සේරිවාණිජ:- එහෙනම් නිකම් බලන්න. සල්ලි ඕන නෑ. මේවා බලන්න සල්ලි අය කරන්නනේ නෑනේ.

- රංග භූමි අලංකරණ බහුල වශයෙන් යොදා ගෙන නොමැත.
- වළලු කද, රන්තැලිය ආදී වූ නාට්‍යෝපකරණ කිහිපයක් පමණක් යොදා ගෙන ඇත.
- ජාතක කතාවක් පදනම් කර ගෙන නිර්මාණය වූ නාට්‍යයක් බැවින් ඉන් හැඟවෙන යුගයට ගැලපෙන ආකාරයට කාල්පනිකව වේෂ භූෂණ නාට්‍යධර්මී නාට්‍ය ශෛලියට ගැලපෙන ලෙස නිර්මාණය කර ඇත.
- අංග රචනාවන් ද නාට්‍ය ධර්මී ශෛලියට අනුගතව සිදු කර ඇත.

'නාට්‍යය නිෂ්පාදනය ගැන වචනයක්' යන සටහන තුළ නාට්‍යය නිෂ්පාදනය කිරීමට පසුබිම් සැරසිලි අනවශ්‍යය. වුවමනා නම් වීදියක් අසල පිහිටි සිටු මැදුරක ගෙ පිළක බව ඇඟවීමට ඊට අනුකූල සංකේතයක් පසුබිමෙහි යැදිය හැක."

කදා වළලු නාට්‍යය ස්වභාවික හා නාටය ධර්මී යන සම්ප්‍රදායන් දෙකෙහිම සම්මිශ්‍රණයක් ලෙස හැඳින්විය හැකි වුව ද වඩාත් බහුල වශයෙන් දැකිය හැකි වන්නේ නාට්‍ය ධර්මී ලක්ෂණයන් වන බැවින් කදා වළලු නාට්‍යය නාට්‍ය ධර්මී ශෛලියට අයත් බව සැලකීම වඩාත් සුදුසු වේ.





**පැවරුම**

**කදා වළලු නාට්‍යය පෙළ කියවා ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ලක්ෂණ පෙළ ගස්සන්න.**

| ලෝක ධර්මී ලක්ෂණ | නාට්‍ය ධර්මී ලක්ෂණ |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |